**ශ්‍රී ලංකා මහ බැංකුව**
**இலங்கை மத்திய வங்கி**
**CENTRAL BANK OF SRI LANKA**

# බැංකු පරීක්ෂක තනතුරු (කොන්ත්‍රාත් පදනම මත)
# ගිණුම්කරණය/ විගණනය, තොරතුරු තාක්ෂණය සහ භාණ්ඩාගාර මෙහෙයුම් යන ක්ෂේත්‍ර සඳහා

## ❖ බැංකු පරීක්ෂක තනතුර - ගිණුම්කරණය/ විගණනය

**රැකියාවේ වගකීම්:**

- ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නියාමනය කරනු ලබන බලපත්‍රලාභී බැංකුවල ව්‍යවස්ථාපිත පරීක්ෂණ පැවැත්වීම.
- පවරන ලද බැංකුවල ගැටලු නිරාකරණය කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ අදාළ නියාමන විධිවිධාන සහ ශිෂ්ට ප්‍රයෝග බලතල ප්‍රකාරව කාලීන පිළියම් ක්‍රියාමාර්ග නිර්දේශ කිරීම සහ පිළියෙල කිරීම.
- ව්‍යවස්ථාපිත පරීක්ෂණ වලදී කරනු ලබන නිර්දේශ ක්‍රියාත්මක කිරීමට අදාළව අනෙකුත් බැංකු පරීක්ෂකවරුන්/ සුපරීක්ෂකවරුන් සමඟ සම්බන්ධීකරණය.
- බලපත්‍රලාභී බැංකුවල මෙහෙයුම් කටයුතු සහ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන නියාමනයන් පිළිබඳව අදාළ පාර්ශ්වයන්ගේ විමසීම් සඳහා ප්‍රතිචාර දැක්වීම.
- නුදුරු අනාගතයේ දී බැංකු පද්ධතියේ ඇතිවිය හැකි අවදානම් තක්සේරු කිරීම සහ මූල්‍ය පද්ධති ස්ථායීතාව තහවුරු කිරීමට අදාළ නිර්දේශ ඉදිරිපත් කිරීම.
- පරීක්ෂණ තාක්ෂණික ශිල්පක්‍රම වැඩි දියුණු කිරීම සහ පැනනගින අවදානම් වලට අනුගතවීම සඳහා නියාමන මාර්ගෝපදේශ, ක්ෂේත්‍ර ප්‍රවණතා සහ මූල්‍ය වෙළෙඳපොළ තත්ත්වයන්හි වෙනස්කම් සම්බන්ධයෙන් යාවත්කාලීන වීම.
- ශ්‍රී ලංකා මහ බැංකුවේ අදාළ පාර්ශ්වයන් වෙත පුහුණු සහ දැනුවත් කිරීමේ සැසි පැවැත්වීම.
- මතුවන්නාවූ අවදානම් සහ නියාමන වෙනස්කම් වලට අදාළව විශේෂ ව්‍යාපෘති, පර්යේෂණ සහ දත්ත විශ්ලේෂණ සඳහා සහාය වීම.

**අවශ්‍ය අවම අධ්‍යාපනික/වෘත්තීය සුදුසුකම් සහ පළපුරුද්ද:**

(අ) ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් දේශීය හෝ විදේශීය විශ්වවිද්‍යාලයකින් පිරිනමනු ලැබූ, අවම වශයෙන් දෙවන පංතිය ඉහළ පෙළ සාමාර්ථයක් (2nd Class Upper Division) හෝ ශ්‍රේණි ලකුණුවල සාමාන්‍යය (GPA) 4.0 කින් අවම වශයෙන් 3.5 ක් හෝ බර තැබූ සාමාන්‍ය ලකුණු අවම වශයෙන් 75% ක් සහිත ගිණුම්කරණය/බැංකුකරණය/මූල්‍යය/ ව්‍යාපාර පරිපාලනය/සංඛ්‍යානය යන විෂයයන්හි විශේෂිත උපාධියක් (අවම වශයෙන් තෙවසරක් (03) ); හෝ
(ආ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ (CA Sri Lanka) ආශ්‍රිත සාමාජිකයෙකු වීම; හෝ
(ඇ) එක්සත් රාජධානියේ වරලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ (CIMA - UK) ආශ්‍රිත සාමාජිකයෙකු වීම; හෝ
(ඈ) වරලත් සහතිකලත් ගණකාධිකාරී සංගමයේ (ACCA) ආශ්‍රිත සාමාජිකයෙකු වීම; හෝ
(ඉ) ඇමෙරිකා එක්සත් ජනපදයේ වරලත් මූල්‍ය විශ්ලේෂක ආයතනයේ වරලත් සාමාජිකයෙකු වීම (CFA Charter Holder) (CFA - USA); හෝ
(ඊ) ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ (CMA - SL) ආශ්‍රිත සාමාජිකයෙකු වීම; හෝ
(උ) අවදානම් වෘත්තිකයන්ගේ ගෝලීය සංගමයෙන් ලබා ගත් මූල්‍ය අවදානම් කළමනාකාර (FRM) සුදුසුකම

**සහ**

බැංකු, මූල්‍යය, විගණනය සහ අවදානම් කළමනාකරණ ක්ෂේත්‍රයන්ට අදාළව විධායක භූමිකාවක අවම වශයෙන් තෙවසරක (03) පළපුරුද්ද.

## ❖ බැංකු පරීක්ෂක තනතුර - තොරතුරු තාක්ෂණ අවදානම්

**රැකියාවේ වගකීම්:**

- ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නියාමනය කරනු ලබන බලපත්‍රලාභී බැංකුවල තොරතුරු සුරක්ෂිතතාව, තාක්ෂණ අවදානම් කළමනාකරණය සහ මෙහෙයුම් අවදානම් කළමනාකරණයට අදාළව ස්ථානීය සහ විතැන් අධීක්ෂණය.
- තොරතුරු සුරක්ෂිතතාවය, තාක්ෂණ අවදානම් කළමනාකරණය සහ මෙහෙයුම් අවදානම් කළමනාකරණය පිළිබඳ මාර්ගෝපදේශ සහ අදාළ නියාමනයන් සකස්කිරීම සහ අධීක්ෂණ රාමුවක් සංවර්ධනය කිරීම.
- ශ්‍රී ලංකා මහ බැංකුවේ අධීක්ෂණමය තාක්ෂණය (SupTech) සහ නියාමන තාක්ෂණය (RegTech) යන කර්තව්‍යයන් ක්‍රියාත්මක කිරීම සඳහා සංකල්ප සකස්කිරීම හා එය ක්‍රියාත්මක කිරීමට දායක වීම.

**අවශ්‍ය අවම අධ්‍යාපනික/වෘත්තීය සුදුසුකම් සහ පළපුරුද්ද:**

(අ) ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් දේශීය හෝ විදේශීය විශ්වවිද්‍යාලයකින් පිරිනමනු ලැබූ, අවම වශයෙන් දෙවන පංතිය ඉහළ පෙළ සාමාර්ථයක් (2nd Class Upper Division) හෝ ශ්‍රේණි ලකුණුවල සාමාන්‍යය (GPA) 4.0 කින් අවම වශයෙන් 3.5 ක් හෝ බර තැබූ සාමාන්‍ය ලකුණු අවම වශයෙන් 75% ක් සහිත පරිගණක විද්‍යාව/තොරතුරු තාක්ෂණය/තොරතුරු සුරක්ෂිතතාවය/සයිබර් ආරක්ෂාව යන විෂයයන්හි විශේෂිත උපාධියක් (අවම වශයෙන් තෙවසරක් (03)); හෝ ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් දේශීය හෝ විදේශීය විශ්වවිද්‍යාලයකින් ලබා ගත්, පරිගණක විද්‍යාව/ තොරතුරු තාක්ෂණය/ තොරතුරු සුරක්ෂිතතාවය/ සයිබර් ආරක්ෂාව යන විෂයයන්හි ශාස්ත්‍රපති හෝ ඉහළ මට්ටමේ ( අවම වශයෙන් වසරක් (01)) පශ්චාද් උපාධියක්;

**සහ**

ඉහත සුදුසුකම් ලැබීමෙන් පසු පිළිගත් ආයතනයක උපදේශනය, ඉංජිනේරුකරණය, විගණනය හෝ අවදානම් කළමනාකරණයට අදාළව පරිගණක විද්‍යාව/ තොරතුරු තාක්ෂණය/ තොරතුරු සුරක්ෂිතතාවය/ සයිබර් ආරක්ෂාව සම්බන්ධයෙන් අවම වශයෙන් තෙවසරක (03) පළපුරුද්ද

## ❖ බැංකු පරීක්ෂක තනතුර - භාණ්ඩාගාර මෙහෙයුම් අධීක්ෂණය

**රැකියාවේ වගකීම්:**

- භාණ්ඩාගාර ගනුදෙනු, අභ්‍යන්තර පාලන, නියාමන අවශ්‍යතා, භාණ්ඩාගාර පද්ධති සහ වෙළඳපොළ හැසිරීම ඇතුළුව, බලපත්‍රලාභී බැංකුවල භාණ්ඩාගාර මෙහෙයුම් පිළිබඳව ව්‍යවස්ථාපිත පරීක්ෂණ පැවැත්වීම.

**අවශ්‍ය අවම අධ්‍යාපනික/වෘත්තීය සුදුසුකම් සහ පළපුරුද්ද:**

(අ) ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් දේශීය හෝ විදේශීය විශ්වවිද්‍යාලයකින් පිරිනමනු ලැබූ, අවම වශයෙන් දෙවන පංතිය ඉහළ පෙළ සාමාර්ථයක් (2nd Class Upper Division) හෝ ශ්‍රේණි ලකුණුවල සාමාන්‍යය (GPA) 4.0 කින් අවම වශයෙන් 3.5 ක් හෝ බර තැබූ සාමාන්‍ය ලකුණු අවම වශයෙන් 75% ක් සහිත ගිණුම්කරණය/ මූල්‍යය/මූල්‍ය කළමනාකරණය/ව්‍යාපාර පරිපාලනය/රාජ්‍ය පරිපාලනය/වාණිජ්‍යය යන විෂයයන්හි විශේෂිත උපාධියක් (අවම වශයෙන් තෙවසරක් (03) ) සමඟ පහත සඳහන් එක් සුදුසුකමක්;

i. මූල්‍ය වෙළෙඳපොළ සංගමයෙන් (ACI-FMA) ලබා ගත් ගනුදෙනු කිරීමේ/මෙහෙයුම් සහතිකය හෝ ඩිප්ලෝමාව; හෝ
ii. ශ්‍රී ලංකා මහ බැංකු විදු පියෙසෙන් ලබා ගත් භාණ්ඩාගාර සහ විදේශීය විනිමය මෙහෙයුම් පිළිබඳ ඩිප්ලෝමාව; හෝ
iii. ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයෙන් ලබා ගත් භාණ්ඩාගාර සහ අවදානම් කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාව; හෝ
iv. ඇමෙරිකා එක්සත් ජනපදයේ වරලත් මූල්‍ය විශ්ලේෂක ආයතනයෙන් ලබා ගත් වරලත් මූල්‍ය විශ්ලේෂක සුදුසුකම (CFA -USA); හෝ
v. අවදානම් වෘත්තිකයන්ගේ ගෝලීය සංගමයෙන් ලබා ගත් මූල්‍ය අවදානම් කළමනාකාර (FRM) සුදුසුකම.

**සහ**

ඉහත සුදුසුකම් ලැබීමෙන් පසු අවම වශයෙන් වසර තුනක (03) පළපුරුද්ද

**උක්ත තනතුරු සඳහා ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාව පූර්ව අවශ්‍යතාවකි. අපේක්ෂකයින් ප්‍රශස්ත වාචික හා ලිඛිත සන්නිවේදන කුසලතාවලින් හෙබි විය යුතු අතර රහස්‍ය හා සංවේදී තොරතුරු මැනවින් හැසිරවීමේ හැකියාව තිබිය යුතුය. තෝරාගත් අයදුම්කරුවන් "අනාවරණය නොකිරීමේ ගිවිසුමකට" එළැඹීම අවශ්‍ය වනු ඇත.**

**අයදුම්පත සමග අධ්‍යාපනික/වෘත්තීය සුදුසුකම් සහ සේවා පළපුරුද්ද සනාථ කිරීමට අදාළ සහතිකවල ඡායා පිටපත් යොමු කිරීමට අයදුම්කරුවන් විසින් වග බලා ගත යුතුය. ඉහත ලියකියවිලිවල ඡායා පිටපත් අමුණා නොමැති අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව බඳවා ගැනීමේ ක්‍රියාවලියේ ඕනෑම අවස්ථාවක දී ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකිය.**

## ❖ වයස:

2024.02.15 දිනට වයස අවුරුදු 40ට වඩා අඩු

## ❖ රැකියාව:

කොන්ත්‍රාත් පදනම මත වසර තුනකට (03) නොවැඩි කාලයක් සඳහා බඳවා ගැනේ. ආරම්භයේ දී වසරක කාලයක් සඳහා කොන්ත්‍රාත් ගිවිසුම් අත්සන් කරනු ලබන අතර කාර්ය සාධනය මත පදනම්ව සෑම වසරක් අවසානයේදීම සේවා ගිවිසුම දීර්ඝ කිරීමට සලකා බලනු ඇත.

## ❖ වැටුප් සහ අනෙකුත් ප්‍රතිලාභ:

සේවක අර්ථසාධක අරමුදලේ සහ සේවක භාරකාර අරමුදලේ දායකත්වය සහිතව රු. 400,000.00 ක (බදු ගෙවිය යුතු) මාසික වේතනය.

## තෝරා ගැනීමේ ක්‍රමවේදය

සම්මුඛ පරීක්ෂණ එකක් හෝ කිහිපයක් මඟින් තෝරා ගැනෙනු ඇත.

## අයදුම්පත්

අයදුම්පතෙහි නියමිත ආකෘති පත්‍රය https://www.cbsl.gov.lk/en/careers යන ශ්‍රී ලංකා මහ බැංකුවේ නිල වෙබ් අඩවියෙන් ලබා ගත හැකිය.

නියමිත ආකෘතියට අනුව සකස් කළ අයදුම්පත් පමණක් ඉදිරිපත් කිරීමට අයදුම්කරුවන් වග බලා ගත යුතු අතර, අවශ්‍ය සියලු ලිපි ලේඛන සහිතව නිසි ලෙස සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2024.02.15 දින හෝ ඊට පෙර අධ්‍යක්ෂ/මානව සම්පත් වෙත ලැබෙන සේ පහත සඳහන් ලිපිනයට **ලියාපදිංචි තැපෑලෙන් පමණක්** යොමු කළ යුතු ය.

අයදුම්පත් එවීමේදී “බැංකු පරීක්ෂක තනතුර (කොන්ත්‍රාත් පදනම මත) - ………………………………………. සඳහා අයදුම් කිරීම” යනුවෙන් ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ පැහැදිලිව සඳහන් කළ යුතු ය.

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට අපේක්ෂිත සුදුසුකම් සහ පළපුරුද්ද සම්පූර්ණ කර නොමැති තැනැත්තන් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් නොලබන අතර අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැති අයදුම්කරුවන්ගේ අයදුම්පත්, අයදුම්පත් බාර ගන්නා දිනට පසු ලැබෙන අයදුම්පත් සහ නියමිත ආකෘතිපත්‍රයට බැහැර අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

සහතිකපත් පරීක්ෂාවේ දී අදාළ සහතිකපත්‍ර වල මුල් පිටපත් ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අපේක්ෂකයන් කවර හේතුවක් යටතේ හෝ මෙම තනතුර සඳහා සුදුසුකම් ලබන අයදුම්කරුවන් සේ සලකනු නොලැබේ.

තෝරා ගැනීම සඳහා කුමන ආකාරයකින් හෝ බලපෑම් කිරීම හෝ එසේ කිරීමට තැත් කිරීම බඳවා ගැනීම සඳහා නුසුදුසුකමක් වේ.

බඳවා ගන්නා සංඛ්‍යාව තීරණය කිරීම, බඳවා ගැනීම කල් දැමීම හෝ අවලංගු කිරීමේ අයිතිය ශ්‍රී ලංකා මහ බැංකුව සතුය. සම්මුඛ පරීක්ෂණ/ය සඳහා කැඳවීමේ දී අයදුම්කරුවන්ගේ අධ්‍යාපනික සුදුසුකම් වලින් ආවරණය වන විෂයය ක්ෂේත්‍රයන්හි අදාළ බව සහ බැංකුවේ අවශ්‍යතාවයට ගැලපෙන පරිදි ඔවුන්ගේ සේවා පළපුරුද්දෙහි අදාළ බව තීරණය කිරීමේ අයිතිය ශ්‍රී ලංකා මහ බැංකුව සතු ය.

බඳවා ගැනීමේ නිර්ණායක අනුව සුදුසුකම් ලබන අපේක්ෂකයන් පමණක් බඳවා ගැනීමේ ක්‍රියාවලියේ ඊළඟ පියවර සඳහා සලකා බලනු ලැබේ


අධ්‍යක්ෂ – මානව සම්පත්
ශ්‍රී ලංකා මහ බැංකුව, අංක 30, ජනාධිපති මාවත, කොළඹ 01.
දුරකථන: 011-2477330 ෆැක්ස්: 011-2477715